සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර III විභාගය - 2026 ජනවාරි

(301) මූල්‍ය වාර්තාකරණය

(Financial Reporting)

2026-02-07
පෙරවරු
[08.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන : 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    උත්තර ලිවීම සඳහා - පැය 03 යි.
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයකම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100.*

A කොටස

(මුළු ලකුණු 20)

01 වන ප්‍රශ්නය

පොදු අරමුණු සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල මූලික අරමුණ වන්නේ අස්තිත්වයට සම්පත් සැපයීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී එහි දැනට සිටින හා විභව ආයෝජකයින්ට, ණය දෙන්නන්ට සහ අනෙකුත් ණයහිමියන්ට වාර්තාකරණ අස්තිත්වය පිළිබඳ ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරු සැපයීම වේ.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) පොදු අරමුණු සඳහා වන මූල්‍ය වාර්තාකරණයේ තොරතුරු භාවිත කරමින් ඇල්මැති පාර්ශවයන්ට ගත හැකි ආර්ථික තීරණ තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) "මූල්‍ය ප්‍රාග්ධනය නඩත්තු කිරීම" (Financial Capital Maintenance) යන සංකල්පය **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

02 වන ප්‍රශ්නය

සංකලිත වාර්තාකරණය යනු සමාගමක කාලපරිච්ඡේදයක් පුරා වටිනාකම ඇති කරන්නේ කෙසේදැයි පෙන්නුම් කිරීමට මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු තනි වාර්තාවක් ලෙස ඒකාබද්ධ කරන ක්‍රියාවලියකි.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) "සංකලිත වාර්තාව" යන පදය **නිර්වචනය කරන්න.** (ලකුණු 03)

(b) සංකලිත වාර්තාවක "අවදානම් සහ අවස්ථා" යටතේ ඇතුළත් කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

03 වන ප්‍රශ්නය

සමාගමක මූල්‍ය ස්ථාවරත්වය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය තක්සේරු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීම සහ අර්ථකථනය කිරීම, මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණයට ඇතුලත් වේ. මෙම ක්‍රියාවලියේදී, ප්‍රධාන මාපක (key metrics) ඇගයීමේදී සහ ප්‍රවණතා හඳුනාගැනීමේදී, මූල්‍ය අනුපාත මගින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) ලාභදායිත්ව අනුපාත දෙකක්(02) සහ ද්‍රවශීලතා අනුපාතයක්(01) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) අනුපාත විශ්ලේෂණයේ සීමාවන් දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

04 වන ප්‍රශ්නය

(a) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතය, අස්තිත්වයේ පෙර කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් අස්තිත්වවල මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනාත්මක බව සහතික කිරීමට පොදු අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා වන පදනම නියම කරනු ලබයි.

ඔබ විසින් කළ යුතු දෑ:

වගකීමක්, ජංගම වගකීමක් ලෙස වර්ගීකරණය කිරීම සඳහා සපුරාලිය යුතු නිර්ණායක දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) **සීමාසහිත ABC සමාගම** විසින් 2023 අප්‍රේල් 01 දින රු.6,800,000/- කට යන්ත්‍රයක් අත්පත් කරගත් අතර, එහි ප්‍රයෝජනවත් ආයුකාලය වසර 4 කි. යන්ත්‍රය, පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. 2025 මාර්තු 31 දින, සමාගම විසින් හානිකරණ පරීක්ෂාවක් (impairment test) සිදුකළ අතර, එහිදී යන්ත්‍රයේ ඉවත්කිරීමේ පිරිවැය අඩුකළ පසු සාධාරණ වටිනාකම (fair value) සහ භාවිතයට ගැනීමේ අගය (value in use) පිළිවෙලින් රු.2,600,000/- ක් සහ රු.3,000,000/- ක් ලෙස ප්‍රත්‍යාගණනය කරන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ:

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 36 - වත්කම් හානිකරණය අනුව යන්ත්‍රයේ හානිකරණ අලාභය **ගණනය කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

A කොටසෙහි අවසානය

B කොටස

(මුළු ලකුණු 30)

05 වන ප්‍රශ්නය

(a) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත Sweet සමාගමේ** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

(1) **සීමාසහිත Sweet සමාගම,** දැනටමත් සංවර්ධනය කර ඇති ජංගම යෙදුමක් (mobile app) වෙනත් තාක්ෂණික සමාගමකින් රු. මිලියන 4 කට මිලදීගෙන ඇත. මෙම යෙදුම මගින් පාරිභෝගිකයින්ට සෘජුවම කේක් ඇණවුම් කිරීමට ඉඩ ලබා දෙයි.

(2) සමාගම විසින් රු.500,000/- ක් දරමින් වෙළෙඳ ලකුණක් වශයෙන් **"සීමාසහිත Sweet සමාගම"** ලියාපදිංචි කරන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ:

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 38 - අස්පෘෂ්‍ය වත්කම් අනුව, ඉහත සඳහන් එක් එක් පිරිවැය අස්පෘෂ්‍ය වත්කම් ලෙස හඳුනාගත හැකිද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) **සීමාසහිත Star සමාගම** විසින් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2024 අප්‍රේල් 01 දින **ABC බැංකුවෙන්** වාර්ෂිකව 10% ක පොලී අනුපාතිකයක් යටතේ රු.10,000,000/- ක ණය මුදලක් ලබාගන්නා ලදී. එදිනම, සමාගම ඉදිකිරීම් ආරම්භ කරන ලද අතර, කොන්ත්‍රාත්කරුගේ ගෙවීම් සඳහා මෙම රු.10,000,000/- ණය මුදල භාවිත කරන ලදී. 2024 මැයි 01 දින, එම ඉදිකිරීම සඳහාම සමාගම විසින් **PQR බැංකුවෙන්** වාර්ෂිකව 12% ක පොලී අනුපාතයකට තවත් රු.12,000,000/- ක ණය මුදලක් ලබාගන්නා ලදී. මෙම මුදල ස්ථාවර තැන්පතුවක තැන්පත් කළ අතර, මෙම ණය මුදල භාවිත කරන තෙක් රු.720,000/- ක ආයෝජන ආදායමක් උපයා ඇත. මෙම සම්පූර්ණ ණය මුදලම කොන්ත්‍රාත්කරුගේ අවසාන බිල්පත පියවීම සඳහා 2025 ජනවාරි 31 දින භාවිත කරන ලදී. මුළු ඉදිකිරීම් පිරිවැය රු.25,000,000/- ක් වූ අතර, මෙම ගොඩනැගිල්ල 2025 පෙබරවාරි 01 දින සිට මෙහෙයුම් කටයුතු සඳහා භාවිත කරන ලදී. ඉහත ණය මුදල් දෙකෙහි ප්‍රාග්ධන ආපසු ගෙවීම, 2025 අප්‍රේල් 01 දින සිට ආරම්භ කරන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ:

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 23 - ණය ගැනුම් පිරිවැය අනුව, 2025 මාර්තු 31 දිනට ගොඩනැගිල්ල මත ප්‍රාග්ධනිත කළ යුතු ණය ගැනුම් පිරිවැය **ගණනය කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

06 වන ප්‍රශ්නය

සීමාසහිත Emelie (පෞද්ගලික) සමාගමේ 2025 මාර්තු 31 දිනට සහ 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ:

සීමාසහිත Emelie (පෞද්ගලික) සමාගම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන *(රු.'000)*

මාර්තු 31 දිනට	2025	2024
ජංගම නොවන වත්කම්:		
දේපළ, පිරියත සහ උපකරණ	138,690	136,420
සමුච්චිත ක්ෂය	(127,930)	(109,730)
ධාරණ අගය	**10,760**	**26,690**
ජංගම වත්කම්:		
තොග	258,700	208,710
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්	54,730	148,760
මුදල් සහ මුදල්වලට සමාන දෑ	269,709	161,083
	583,139	**518,553**
මුළු වත්කම්	**593,899**	**545,243**
ස්කන්ධය සහ වගකීම්:		
ස්කන්ධය:		
ප්‍රකාශිත ප්‍රාග්ධනය	300,000	250,000
රඳවාගත් ඉපැයීම්	49,013	28,763
	349,013	**278,763**
ජංගම නොවන වගකීම්:		
බැංකු ණය	90,790	127,600
සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම)	20,470	19,460
	111,260	**147,060**
ජංගම වගකීම්:		
වෙළෙඳ ගෙවිය යුතු මුදල්	124,376	101,400
ණය මත ගෙවිය යුතු පොලිය	5,470	13,800
ගෙවිය යුතු ආදායම් බදු	3,780	4,220
	133,626	**119,420**
මුළු ස්කන්ධය සහ වගකීම්	**593,899**	**545,243**

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන ආදායම් බදු වියදම රු.3,250,000/- කි. සමාගමේ ණය පොලී සහ බදු පෙර ලාභය රු.25,500,000/- ක් වේ.

(2) 2024 සැප්තැම්බර් 30 දින, මෝටර් රථයක් රු. මිලියන රු. 5.5 කට විකුණන ලදී. මෝටර් රථයේ පිරිවැය රු. මිලියන 6 ක් වූ අතර, 2024 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය රු. මිලියන 3.75 ක් විය. මෝටර් රථ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට වසර 5 ක් පුරා ක්ෂය කරනු ලබයි. එම ඉවත් කරන ලද මෝටර් රථය වෙනුවට 2024 ඔක්තෝම්බර් 01 දින, නව රථයක් මිලට ගත් අතර, එය එදිනම ප්‍රාග්ධනීත කරන ලදී.

(3) වර්ෂය සඳහා වන ණය මත පොලී වියදම රු.2,000,000/- ක් වන අතර, වර්ෂය තුළදී සමාගම විසින් රු.7,500,000/- ක නව ණය මුදලක් ලබාගන්නා ලදී.

(4) වර්ෂය සඳහා වන පාරිතෝෂික වෙන්කිරීම රු.1,100,000/- ක් වේ.

(5) වර්ෂය තුළදී, සමාගම විසින් එහි දැනට සිටින කොටස්හිමියන් වෙත නව කොටස් නිකුතුවක් සිදුකරන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ:

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත Emelie (පෞද්ගලික) සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වක්‍ර ක්‍රමය යටතේ **පිළියෙල කරන්න.** (ලකුණු 10)

07 වන ප්‍රශ්නය

(a) **සීමාසහිත Tasty සමාගමේ** 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු සපයා ඇති අතර, 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මේවා සැලකිල්ලට ගෙන නොතිබුණි:

(1) ආහාර විෂවීමකට චෝදනා කරමින්, සමාගමේ පාරිභෝගිකයෙකු රු. මිලියන 2 ක වන්දි ඉල්ලා සමාගමට එරෙහිව නඩුවක් 2025 මාර්තු 30 දින ගොනු කර ඇත. සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමේ දිනය තෙක් පවතින සාක්ෂි මත පදනම්ව, මේ සඳහා සමාගම වගකිව යුතු නොවන බව පෙනෙන්නට ඇති බව සමාගමේ නීති උපදේශකයින් උපදෙස් දී ඇත.

(2) 2023/24 තක්සේරු වර්ෂයට අදාලව රු. මිලියන 1.5 ක වියදම් ඉඩ නොදෙමින්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ආදායම් බදු මත තක්සේරුවක් නිකුත් කර ඇත. මේ සඳහා පිළිතුරු සහ සාක්ෂි කිහිප වාරයක් යැවීමෙන් පසු, 2025 අප්‍රේල් 30 දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රු.500,000/- ක වියදම් ඉඩ නොදෙමින් මෙය අවසන් කරන ලදී.

(3) විෂමාචාරයක් හේතුවෙන් සේවය අවසන් කරන ලද සමාගමේ හිටපු සේවකයෙකු රු. මිලියන 1 ක වන්දියක් ඉල්ලා සමාගමට එරෙහිව නඩුවක් ගොනු කර ඇත. සාක්ෂි මත පදනම්ව, මෙම වන්දි මුදල ගෙවීම සඳහා ඉහළ සම්භාවිතාවයක් ඇති බවට සමාගමේ නීතිඥයින් විශ්වාස කරනු ලබයි. අවසානයේදී, වන්දි වශයෙන් රු.800,000/- ක් ගෙවීමට අධිකරණය විසින් 2025 මැයි 15 දින නියම කරන ලදී.

2025 මැයි 30 දින, සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුමත කර ඇති බවට උපකල්පනය කරන්න.

ඔබ විසින් කළ යුතු දෑ:

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් අනුව, **සීමාසහිත Tasty සමාගමේ** 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන තුළ ඉහත එක් එක් සිදුවීම් හඳුනාගත යුත්තේ කෙසේද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) **සීමාසහිත Ultima සමාගම,** 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන අවසන්කොට ඇත.

2024 අප්‍රේල් 01 දිනට, **සීමාසහිත Ultima සමාගමේ** ගිණුම් පොත්වල, පහත සඳහන් ශේෂයන් පෙන්නුම් කරන ලදී:

	රු.
යන්ත්‍ර ගිණුම	8,000,000
සමුච්චිත ක්ෂය - යන්ත්‍ර	3,000,000

අත්පත් කර ගත් අවස්ථාවේදී, යන්ත්‍රවල ප්‍රයෝජනවත් ආයු කාලය වසර 5 ක් ලෙස ඇස්තමේන්තුගත කර තිබුණි. කෙසේවුවද, 2024 අප්‍රේල් 01 දින යන්ත්‍රවල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනයකින් පසුව 2024 අප්‍රේල් 01 දිනට යන්ත්‍රවල ඉතිරි ප්‍රයෝජනවත් ආයුකාලය වසර 4 ක් බවට හෙළිදරව් විය. **සීමාසහිත Ultima සමාගම** එහි යන්ත්‍ර, පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

ඔබ විසින් කළ යුතු දෑ:

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි ප්‍රමිතයට අනුව, **සීමාසහිත Ultima සමාගමේ** 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා යන්ත්‍ර ක්ෂය අය කිරීම **ගණනය කරන්න**.

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

B කොටසෙහි අවසානය

C කොටස

(මුළු ලකුණු 50)

08 වන ප්‍රශ්නය

සීමාසහිත Ultra පොදු සමාගමේ ගිණුම් පොත්වලින් 2025 මාර්තු 31 දිනට, පහත සඳහන් ශේෂ පිරික්සුම උපුටාගෙන ඇත:

සීමාසහිත Ultra පොදු සමාගම

2025 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම *(රු.'000)*

	හර	බැර
ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 100,000,000)		100,000
2024 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම්		31,500
ප්‍රත්‍යාගණන සංචිතය		3,000
දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට:		
ඉඩම - ප්‍රත්‍යාගණිත අගයට	58,000	
ගොඩනැගිලි	36,000	
මෝටර් වාහන	18,000	
2024 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:		
ගොඩනැගිලි		16,000
මෝටර් වාහන		9,000
ගෙවන ලද කල්බදු කුළී	4,276	
2025 මාර්තු 31 දිනට තොගය, පිරිවැයට	43,000	
වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල්	41,000	45,819
අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල්	56,300	
2024 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා වන ප්‍රතිපාදනය		4,200
ගෙවූ ආදායම් බදු	16,500	
විකුණුම් පිරිවැය / විකුණුම්	285,200	459,955
ඉදිරියට කළ ගෙවීම්	2,400	
2024 අප්‍රේල් 01 දිනට ගෙවිය යුතු ආදායම් බදු		6,100
පරිපාලන වියදම්	61,298	
බෙදාහැරීමේ වියදම්	42,100	
මූල්‍ය වියදම්	11,500	
	675,574	**675,574**

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2025 මාර්තු 31 දිනට පැවති අවසාන තොග ශේෂය තුළ, සෙමින් චලනය වන (slow moving), රු.9,000,000/- ක් පිරිවැය වන ඒකක 1,000 කින් යුත් තොගයක්, ඇති බව අනාවරණය විය. මෙම තොගය, 2025 අප්‍රේල් මාසයේදී රු.100,000/- ක ප්‍රවාහන පිරිවැයක් දැරීමෙන් පසු විකුණුම් මිලෙන් 50% ක වට්ටමක් යටතේ විකුණන ලදී. ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රු.10,000/- කි.

(2) 2025 මාර්තු 31 දින, සමාගමේ මෝටර් ලොරිවලින් එකක් ගිනි ගැනීම නිසා සම්පූර්ණයෙන්ම විනාශ විය. මෙම ලොරි රථය 2021 අප්‍රේල් 01 දින පිරිවැය රු.6,000,000/- කට මිලදීගෙන තිබුණි. 2025 අප්‍රේල් 10 දින රක්ෂණ සමාගම විසින් හානිය තක්සේරු කර රු.2,500,000/- ක් වන්දියක් ලෙස ගෙවීමට එකඟ විය. මේ සම්බන්ධයෙන් කිසිදු සටහනක් ගිණුම් පොත්වල තබා නොමැත.

(3) 2024 අප්‍රේල් 01 දින, සමාගම විසින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මෝටර් රථයක් මිලට ගන්නා ලදී. කල්බදු මෝටර් රථයේ සාධාරණ වටිනාකම රු.10,493,500/- ක් වූ අතර, එහි කල්බදු කාල සීමාව වසර 4 ක් විය. රු.2,776,000/- ක් වන වාර්ෂික කල්බදු වාරිකය සෑම වර්ෂයකම මාර්තු 31 දිනට ගෙවිය යුතු වේ. වාර්ෂික ව්‍යංග පොළී අනුපාතය 9% කි. කල්බදු කාලසීමාව අවසානයේදී මෝටර් රථයේ හිමිකම **සීමාසහිත Ultra පොදු සමාගම** වෙත මාරු වේ. කල්බද්ද ආරම්භයේදීම සිදුකළ මූලික ගෙවීම වූ රු. මිලියන 1.5 සහ 2025 මාර්තු 31 දින ගෙවන ලද පළමු කල්බදු වාරිකය වන රු.2,776,000/- ක මුදල, "ගෙවන ලද කල්බදු කුලී" ගිණුමේ වාර්තාකර ඇත. මීට අමතරව, මේ සම්බන්ධව වෙනත් කිසිදු සටහන් ගිණුම් පොත්වල තබා නොමැත.

(4) 2021/22 මූල්‍ය වර්ෂය තුළ, ඉඩම ප්‍රත්‍යාගණනය කළ අතර, නැවතත් සමාගම විසින් එම ඉඩම 2025 මාර්තු 31 දින රු.60,000,000/- කට ප්‍රත්‍යාගණනය කරන ලදී. නමුත්, මෙය ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

(5) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

ගොඩනැගිලි	:	වර්ෂ 40
මෝටර් වාහන	:	වර්ෂ 04

(6) වර්ෂය තුළදී, සමාගමට රු.3,500,000/- ක මුදලක් ලැබිය යුතුව තිබූ ණයගැතියෙකු බුන්වත්භාවයට පත්ව ඇති බව ප්‍රකාශ කරන ලදී. ඔහුගෙන් ලැබිය යුතු මුදල, අයකරගත නොහැකි අතර, එය බොල් ණයක් ලෙස ලියා හැරිය යුතු වේ. සමාගම, දැනටමත් මෙම ගනුදෙනුකරු සඳහා පසුගිය මූල්‍ය වර්ෂයේදී සම්පූර්ණ ප්‍රතිපාදනයක් ගිණුම් පොත්වල සිදුකොට ඇත. තවද, 2025 මාර්තු 31 දිනට පැවති ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා 10% ක ප්‍රතිපාදනයක් පවත්වාගෙන යාමට තීරණය කර ඇත.

(7) 2023/24 තක්සේරු වර්ෂය සඳහා වන ආදායම් බදු වගකීම රු.6,100,000/- ක් වූ අතර, එය 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී ගෙවූ අතර, එම ගෙවූ මුදල "ගෙවූ ආදායම් බදු" ගිණුමට අයකොට ඇත. 2024/25 තක්සේරු වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම, රු.10,500,000/- ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

(8) 2025 සම්පූර්ණ ලිත් වර්ෂය සඳහා වන කුලී ගෙවීම, "ඉදිරියට කළ ගෙවීම්" ගිණුමේ ඇතුළත් වේ.

(9) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය 2025 මැයි 31 දින ලබාදෙන ලදී.

ඔබ විසින් කල යුතු දෑ:

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත Ultra පොදු සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න**:

(a) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභා'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 09)

(b) 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 08)

(c) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 03)

(d) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන සටහන. (ලකුණු 05)

(මුළු ලකුණු 25)

09 වන ප්‍රශ්නය

සීමාසහිත SRJ පොදු සමාගමේ 2025 මාර්තු 31 දිනෙන් සහ 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂ සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවල උද්ධෘතයන් සහ 2025 මාර්තු 31 දිනට සහ 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල උද්ධෘතයන් පහත සඳහන් පරිදි වේ:

සීමාසහිත SRJ පොදු සමාගම

ආදායම් ප්‍රකාශනවල උද්ධෘතයන් *(රු.'000)*

මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා	**2025**	**2024**
විකුණුම්	1,921,320	1,680,400
විකුණුම් පිරිවැය	(1,500,520)	(1,476,800)
දළ ලාභය	**420,800**	**203,600**
පොළී වියදම	(18,230)	(14,200)
ආදායම් බදු	(11,400)	(12,500)
බදු පසු ශුද්ධ ලාභය	**128,790**	**118,470**

සීමාසහිත SRJ පොදු සමාගම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල උද්ධෘතයන් *(රු.'000)*

මාර්තු 31 දිනට	**2025**	**2024**
ජංගම වත්කම්	799,460	1,178,000
ජංගම වගකීම්	116,700	124,890
තොගය	110,700	108,400
වෙළෙඳ ලැබිය යුතු මුදල්	587,200	420,680
වෙළෙඳ ගෙවිය යුතු මුදල්	116,800	112,100
පොළී සහිත ණය	46,870	54,200
කොටස්හිමියන්ගේ ස්කන්ධය	159,400	134,100

මුළු විකුණුම්වලින් 60% ක් ණයට කල විකුණුම් වන අතර, විකුණුම් පිරිවැයෙන් 75% ක් ගැනුම් වන අතර, එයින් 90% ක් ණය පදනම මත සිදුකරනු ලැබේ.

ඔබ විසින් කල යුතු දෑ:

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, **සීමාසහිත SRJ පොදු සමාගමේ** 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට පහත සඳහන් අනුපාතයන් **ගණනය කරන්න**:

(a) දළ ලාභ අනුපාතය.

(b) ශුද්ධ ලාභ අනුපාතය.

(c) තොග රඳවා ගැනීමේ කාලය.

(d) ණයගැති එකතුකිරීමේ කාලය.

(e) ණයහිමි පියවීමේ කාලය. (ලකුණු 10)

10 වන ප්‍රශ්නය

2024 අප්‍රේල් 01 දින, **සීමාසහිත සීදේවි පොදු සමාගම, සීමාසහිත දේවි පොදු සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 90% ක්, රු. මිලියන 160 කට අත්පත් කරගන්නා ලදී.

සීමාසහිත සීදේවි පොදු සමාගමේ සහ **සීමාසහිත දේවි පොදු සමාගමේ** 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ:

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන *(රු.'000)*

2025 මාර්තු 31 දිනට	**සීමාසහිත සීදේවි පොදු සමාගම**	**සීමාසහිත දේවි පොදු සමාගම**
ජංගම නොවන වත්කම්:		
දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ අගයට	350,000	165,000
සීමාසහිත දේවි පොදු සමාගමේ සිදුකල ආයෝජනය	160,000	-
සීමාසහිත දේවි පොදු සමාගමේ ණයකරවල ආයෝජනය	30,000	-
ජංගම වත්කම්:		
තොග	85,000	45,000
වෙළෙඳ ලැබිය යුතු මුදල්	60,000	34,200
මුදල් සහ මුදල්වලට සමාන දෑ	20,700	71,000
	165,700	150,200
මුළු වත්කම්	**705,700**	**315,200**
ස්කන්ධය:		
ප්‍රකාශිත ප්‍රාග්ධනය	400,000	150,000
රඳවාගත් ඉපැයීම්	210,000	37,000
මුළු ස්කන්ධය	**610,000**	**187,000**
ජංගම නොවන වගකීම්:		
ණයකර	-	100,000
ජංගම වගකීම්:		
වෙළෙඳ ගෙවිය යුතු මුදල්	93,700	25,200
වෙනත් ගෙවිය යුතු මුදල්	2,000	3,000
	95,700	28,200
මුළු ස්කන්ධය සහ වගකීම්	**705,700**	**315,200**

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) අත්පත් කරගත් දිනට, **සීමාසහිත දේවි පොදු සමාගමේ** ඉඩම හැර ශුද්ධ වත්කම්වල පොත් අගය මගින් ඒවායේ සාධාරණ අගය නිරූපණය වේ. ඉඩමේ සාධාරණ අගය රු. මිලියන 53 ක් වන අතර, එහි පොත් අගය රු. මිලියන 45 කි. අත්පත් කරගත් දිනට, පාලනය නොවන හිමිකමෙහි සාධාරණ අගය [Non-Controlling Interest (NCI)] රු. මිලියන 35 ක් සහ **සීමාසහිත දේවි පොදු සමාගමේ** 2024 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් රු.25,000,000/- ක් විය.

(2) වර්ෂය තුළදී, රු.30,000,000/-ක් වටිනා භාණ්ඩ, **සීමාසහිත දේවි පොදු සමාගම** විසින් **සීමාසහිත සීදේවි පොදු සමාගමට** විකුණන ලදී. **සීමාසහිත දේවි පොදු සමාගමේ** විකුණුම් ප්‍රතිපත්තිය වනුයේ පිරිවැය මත 20% ක ලාභයක් පවත්වා ගැනීම වේ. 2025 මාර්තු 31 දිනට, **සීමාසහිත සීදේවි පොදු සමාගමේ** පැවති අවසාන තොගය තුළ **සීමාසහිත දේවි පොදු සමාගමෙන්** මිලට ගත් රු.6,000,000/- ක් වටිනා භාණ්ඩ ඇතුළත් විය. **සීමාසහිත දේවි පොදු සමාගමේ** වෙළෙඳ ලැබිය යුතු මුදල් තුළ සහ **සීමාසහිත සීදේවි පොදු සමාගමේ** වෙළෙඳ ගෙවිය යුතු මුදල් තුළ පිළිවෙලින් **සීමාසහිත සීදේවි පොදු සමාගමෙන්** ලැබිය යුතු සහ **සීමාසහිත දේවි පොදු සමාගමට** ගෙවිය යුතු රු.20,000,000/- ක් ඇතුළත්ය.

(3) 2024 අප්‍රේල් 01 දින, **සීමාසහිත සීදේවි පොදු සමාගම** විසින් මෝටර් ලොරි රථයක් රු.7,500,000/- ක මිලකට **සීමාසහිත දේවි පොදු සමාගමට** විකුණන ලදී. එදිනට, **සීමාසහිත සීදේවි පොදු සමාගමේ** පොත්වල එම ලොරි රථයේ ධාරණ අගය රු.6,000,000/- ක් විය. 2024 අප්‍රේල් 01 දිනට මෝටර් ලොරි රථයේ ඉතිරි ප්‍රයෝජනවත් ආයු කාලය වසර 5 කි.

(4) වර්ෂය තුළදී, **සීමාසහිත සීදේවි පොදු සමාගම** විසින් **සීමාසහිත දේවි පොදු සමාගමේ** ණයකරවල ආයෝජනය කරන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) **සීමාසහිත දේවි පොදු සමාගම** අත්පත් කර ගැනීම මත ඇති වූ කීර්තිනාමය **ගණනය කරන්න**. (ලකුණු 04)

(b) 2025 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **පිළියෙල කරන්න**. (ලකුණු 11)

(මුළු ලකුණු 15)

C කොටසෙහි අවසානය

කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
දැනුම (1)	තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම	අදින්න	හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම.
		සම්බන්ධ කරන්න	තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම.
		සඳහන් කරන්න	ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම.
		හඳුනා දක්වන්න	සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම.
		ලැයිස්තුගත කරන්න	විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
අවබෝධය (2)	අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම.	හඳුනාගන්න	අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම.
		අර්ථකතනය කරන්න	වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න.
		විස්තර කරන්න	ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න.
		පැහැදිලි කරන්න	අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම.
		නිර්වචනය කරන්න	ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
භාවිතය (3)	අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම.	සසඳන්න	තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න.
		ප්‍රස්තාර දක්වන්න	ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න.
		තක්සේරු කරන්න	වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න.
		විසඳන්න	ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම.
		පිළියෙල කරන්න	විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම.
		ප්‍රදර්ශනය කරන්න	උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම.
		ගණනය කරන්න	ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම.
		භාවිත කරන්න	ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න.

නිපුණතා මට්ටම	විස්තරය	ක්‍රියා ලැයිස්තුව	ක්‍රියා නිර්වචනය
විශ්ලේෂණය (4)	අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම.	සන්නිවේදනය කරන්න	තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම.
		සැකිල්ලක් සේ දක්වන්න	සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම.
		අසමානතා බලන්න	අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම.
		සමානකම් බලන්න	සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම.
		විමසන්න	තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම.
		වෙනස්කොට දක්වන්න	යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම.
		විශ්ලේෂණය කරන්න	විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න.